ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1998 අංක 28 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 04 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජුනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 5.75 යි.** **තැපැල් ගාස්තුව : රු. 2.50 යි.**

**1998 අංක 28 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1998 ජූනි මස 04 වන දින]

එල්.ඩී—ඕ. 17/97.

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 28 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 2 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1979 අංක 15 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "අග්‍ර විනිශ්චයකාරවරයා" යන අර්ථ කථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"ළමා අපචාරය" යන්නෙන්, ළමයෙක් සම්බන්ධයෙන් කරනු ලැබූ විට, දණ්ඩ නීති සංග්‍රහයේ 286අ, 288, 288අ, 288ආ, 308අ, 360අ, 360ආ, 360ඇ, 363, 364අ, 365, 365අ හෝ 365ආ වගන්ති යටතේ වූ වරදක් අදහස් වේ.";

(2) "තැනැත්තා" යන අර්ථ කථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"ආරක්ෂා ස්ථානය" යන්නට රක්ෂණ නිවාසයක්, රෝහලක් හෝ භාරය හා රැකවරණය සඳහා වූ යම් ආයතනයක් ඇතුළත් වේ ;".

3. 43 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 43අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියේ 43අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ළමා අපචාරය සම්බන්ධයෙන් සිරභාරයට ගනු ලැබූ තැනැත්තන් පිළිබඳ විශේෂ විධිවිධාන.

43අ. (1) 36 වන සහ 37 වන වගන්තිවල විධිවිධාන ළමා අපචාර සම්බන්ධයෙන් සැක කරනු ලැබූ හෝ චෝදනා කරනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

2—D 047397— 5,900(98/04)

(2) ළමා අපචාරය පිළිබඳ සැක කරනු ලැබූ හෝ චෝදනා ලැබූ යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගනු ලබන පොලිස් නිලධරයකු විසින් සිරභාරයට ගැනීමෙන් පැය විසිහතරක් ඇතුළත අනවශ්‍ය ප්‍රමාදයක් නොමැතිව, ඒ තැනැත්තා නඩුව පිළිබඳ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අත් අඩංගුවට ගනු ලැබූ යම් තැනැත්තෙක් යම් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට පමුණුවනු ලබන්නේ ද ඒ මහේස්ත්‍රාත්වරයා විසින්, විමර්ශන කටයුතු සඳහා ඒ තැනැත්තා රඳවා තබා ගැනීම අවශ්‍ය බවට පොලිස් අධිකාරිවරයකුගේ නිලයට පහළ නොවූ පොලිස් නිලධරයකු විසින් හෝ ඔහු නොමැති විටෙක, ඔහු වෙනුවට ක්‍රියා කරන නිලධරයා විසින් සහතිකයක් ඉදිරිපත් කරනු ලැබූ විට, දින තුනකට නොවැඩි කාලයක් සඳහා එම තැනැත්තා පොලිස් අත් අඩංගුවේ රඳවා තබා ගැනීමට අවසර දෙමින් වූ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(4) විමර්ශනය නිම කරනු ලැබීම හෝ (3) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවෙහි සඳහන් රඳවා තබා ගැනීමේ කාලය සම්පූර්ණ වීම යන දෙකෙන් කවර වූ හෝ දෙයක් කලින් සිදු වුව ද, එම තැනැත්තා මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පමුණුවනු ලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධාන ඒ තැනැත්තාට සහ ඒ තැනැත්තා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 451අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**4.** 451 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 451අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"අපචාරයට පත් වූ ළමයාගේ භාරකාරත්වය ආරක්ෂා ස්ථානයකට පැවරීමේ බලපත්‍රය.

451අ. (1) ළමා අපචාරය සම්බන්ධයෙන් වූ අධිචෝදනාවක් හෝ චෝදනාවක් යම් අධිකරණයක ගොනු කොට ඇති අවස්ථාවක දී ඒ ළමා අපචාරය සිදු කර ඇතැයි කියනු ලබන්නේ

යම් ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා රැක බලා ගැනීම සහ ඔහුට ආරක්ෂාව සැපයීම අවශ්‍ය යයි ඒ අධිකරණයට පෙනී යන විටක, නඩු විභාගය නිම වන තුරු ඒ ළමයා රැක බලා ගැනීම සහ ඔහුට ආරක්ෂාව සැලසීම සඳහා ඒ ළමයා ආරක්ෂා ස්ථානයක රඳවන මෙන් ඒ අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(2) ළමා අපචාරය සිදු කර ඇතැයි කියනු ලබන්නේ යම් ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයාගේ රැකවරණය සහ ආරක්ෂාව සඳහා ඒ ළමයා ආරක්ෂා ස්ථානයක තැබිය යුතු යයි අධිකරණයක් විසින් (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන අවස්ථාවක, දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ බලපත්‍රයක් ඒ අධිකරණය විසින් අත්සන් කොට ඒ අධිකරණයේ පිස්කල් වෙත භාර දිය යුතු ය.".

**5.** 453 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ප්‍රධාන ප්‍රඥප්තියේ 453අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

*ප්‍රධාන ප්‍රඥප්තියේ 453අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

"නඩු විභාග සහ අභියාචනා සඳහා ප්‍රමුඛත්වය දිය යුතු බව.

453අ. ළමා අපචාරය සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ චෝදනා ලැබූ හෝ අධිචෝදනා ලැබූ යම් තැනැත්තකු පිළිබඳ නඩු විභාගයට සහ ළමා අපචාරය පිළිබඳව යම් තැනැත්තකු වරදකරු කිරීමට කර ඇති යම් අභියාචනයක් සහ එසේ වරදකරු කිරීම මත පනවන ලද යම් දණ්ඩන නියමයකට විරුද්ධව විභාග කිරීම සඳහා සෑම අධිකරණයක් විසින් ම ප්‍රමුඛතාව දෙනු ලැබිය යුතු ය.".

**6.** 1997 අංක 19 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

*ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.*

(1) 287 වන වගන්තියට අදාළ සටහන්වලට ඉක්බිතිව ම, පහත දැක්වෙන සටහන් ඇතුළත් කිරීමෙන් :—

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| "288 ළමයින්ට හිංසා කෑමට සැලැස්වීම හෝ කුට්ටනය කිරීම. | වරෙන්තු නොමැතිව සිරභාරයට ගත හැකි ය. | සිතාසි | ඇප දිය නොහැක | සමථයට පත් කළ නොහැක | අවුරුදු පහකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි ය. | මහෙස්ත්‍රාත් අධිකරණය |
| 288අ ලිංගික සංසර්ගය සඳහා කුට්ටානියකු වශයෙන් ක්‍රියා කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම. | එම | එම | එම | එම | අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු පහකට නොවැඩි වූ ද දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. | |
| 288ආ සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම. | එම | එම | එම | එම | අවුරුදු පහකට නොඅඩු වූ සහ අවුරුදු හතකට නොවැඩි වූ ද දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය."; | |

(2) 302 වන වගන්තියට අදාළ සටහන් ඉවත් කිරීමෙන්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

7. 1995 අංක 4 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයෙහි, 11 වන ආකෘතියට ඉක්බිතිව ම පහත දැක්වෙන ආකෘතිය ඇතුළත් කිරීමෙන් මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"අංක 11අ"

ආරක්ෂා ස්ථානයක් වෙත භාර කිරීමේ බලපත්‍ර ආකෘතිය

..............................................මහාධිකරණයේ දී
(හෝ...............................................
මහෙස්ත්‍රාත් අධිකරණයේ දී)
...........................................................පිස්කල්
සහ...............................................
(ආයතනයේ නම)

කළමනාකරු වෙත

.............................................................මේ
අධිකරණය ඉදිරියේ.......................................වරද
සම්බන්ධයෙන් අධිචෝදනා/චෝදනා ලැබ ඇති හෙයින් ද;

එකී වරද..................................................ට
අදාළව සිදුකරනු ලැබ ඇතැයි කියනු ලබන හෙයින් සහ
.............................................එම වරද පිළිබඳ
නඩු විභාගය නිමවන තුරු, එකී..................................ට
රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍යව ඇති හෙයින් ද;

එකී.................................භාර ගෙන ආරක්ෂා
සහිතව................................................. වෙත
රැගෙන ගොස්, ඔබේ අත්සන යටතේ සහතික කරන ලද මේ
බලපත්‍රයේ පිටපතක් ද සහිතව, ඔහු එහි කළමනාකරුට භාරදෙන
ලෙස එකී පිස්කල් වන ඔබට මෙයින් අණ කරනු ලබන අතර,
එකී...............................................ඔබේ භාරයට
ගෙන, ඒ වරද පිළිබඳ නඩු විභාගය නිමවන තුරු ඔහු ඔබේ
රැකවරණය හා ආරක්ෂාව යටතේ ආරක්ෂා සහිතව තබා ගන්නා
ලෙස එකී.....................................................
කළමනාකරු වන ඔබට මම මෙයින් අණ කරමි.

19 ක් වූ.......................මස.......................වන
දින වූ මෙදින මගේ අත්සන යටතේ නිකුත් කරන ලදී.

අත්සන් කළේ

මහාධිකරණයේ/විනිශ්චයකරු/මහෙස්ත්‍රාත්.".

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.